පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය - 2010
-------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මතය**
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

1.2.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**
----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 අංක 22 දරණ පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව පනත | |
| | (i) 3 වැනි වගන්තිය | අධ්‍යයන , පර්යේෂණ , උපදේශන සේවා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු කිරීම සඳහා මුදල් සැපයීමෙන් හා ශ්‍රී ලංකා පුරවැසියන්ට විදේශීය උසස් අධ්‍යාපන ආයතන වලට යාම පිණිස සහ විදේශීය රටවල පුරවැසියන්ට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය හැදෑරීමට විධිවිධාන සැලසීමෙන් සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා කටයුතු කර නොතිබුණි. පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය දැනට ක්‍රියාත්මක නොවන බැවින් පනතේ 3 වැනි වගන්තිය දැක්වෙන අරමුණු ඉටු කිරීමට හැකියාවක් නොමැති බව ලේකම්වරයා දන්වා තිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) 5 වැනි වගන්තිය | පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පාලන මණ්ඩලයක් පත්කර නොතිබුණි. මේ සම්බන්ධව පනතේ 5 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත කථානායකවරයා ශිෂ්‍යත්ව මණ්ඩලයට නම් කිරීමට හැකි වන පරිදි පනත සංශෝධනය කිරීමට පාර්ලිමේන්තු සභානායකවරයාට යොමුකර ඇති බව 2011 මැයි 23 දිනැති ලිපියෙන් ලේකම්වරයා දන්වා තිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | කාර්යය සාධන වාර්තා සහ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබීම හා විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබීම. පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය දැනට ක්‍රියාකාරීව නොතිබීම නිසා මෙම කරුණු ඉටුකළ නොහැකි බව පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලයෙහි ලේකම්වරයා විසින් දන්වා ඇත. |
| (ඇ) | 2007 දෙසැම්බර් 18 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 47 | සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. මෙය සකස් කිරීමේ වගකීම පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය සතු බැවින් සංයුක්ත සැලැස්ම පිළියෙළ කළ නොහැකි බව ශිෂ්‍යත්ව මණ්ඩලයේ ලේකම්වරයා විසින් දන්වා ඇත. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය
-----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,026,711 ක වියදම ඉක්මවූ ආදායම් අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ආදායම් අතිරික්තය රු.632,099 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.394,612 ක වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයෙහි රජයේ ප්‍රදාන රු. 1,000,000 කින් වැඩිවීමද, වාහන නඩත්තු , කාර්යාල උපකරණ නඩත්තු , තැපැල් වියදම් සහ පාර්ලිමේන්තුවට දුන් පරිත්‍යාග යනාදියේ වියදම් රු. 81,223 කින් අඩුවීමද එයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.1.2 **මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

---------------------------------

ආයතනයේ පස්දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලය වෙත 2010 වර්ෂයට රු. 1,164,629 ක වැටුප් හා දමනා ගෙවා තිබුණු අතර, ඒ අතුරින් සිවු දෙනෙකුට සමාලෝචිත වර්ෂයට අදාළ අනුමත පත්වීම් ලිපි නොතිබුණි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

2.2.1 **කාර්ය සාධනය**

------------------

සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනමා නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා

(ආ) නීති, රීති හා රෙගුලාසි